චක්‍රලේඛ අංක: 14/2019
මාගේ අංකය: DO1/01/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත
අංක 109,
මහ වීදිය ,
බත්තරමුල්ල.
2019.12.26

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සණස සමිති හා අනෙකුත් සියලු ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>විධිමත් විනය පරීක්ෂණවලදී පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම</u>

01. කිසියම් සමුපකාර සමිතියක විනය බලධාරියා ලෙස කටයුතු කරනු ලබන්නේ අදාල සමිතියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය /කාරක සභාව වේ. එම නිසා විනය පරීක්ෂණයකදී,විනය පරීක්ෂණ නිලධාරියෙකු පත් කිරීමේ වගකීම අදාල සමිතියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය /කාරක සභාව වෙත පැවරෙනු ඇත.

02. ඒ අනුව, ඉදිරියේදී විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සිදුනොකරනු ලබන බව දන්වන අතර මෙම කාර්යය සඳහා 2020.01.01 දින සිට අදාළ සමිතිය වෙත මෙයින් බලය පවරන බව කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

03. විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීමේ දී සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන විනය පරීක්ෂණ නිලධාරී නාම ලේඛනය, ඒ සඳහා අදාල අදාළ කරගත යුතු බවට කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

සුමිත් සූරවීර
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත්:

I. ලේකම්, පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය, බස්නාහිර පළාත- කා.දැ.ස
II. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත- කා.දැ.ස